රු : 5000.00

207921
න
2014/06/19

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

# නූතන ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික බුදුසමයේ නව ප්‍රවණතා

## (ක්‍රි.ව. 1956 - 2012 දක්වා)

20 NOV 2013

Library - USJP
207921

අධ්‍යයනාංශය : පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ලේඛනාරූඪ අංකය : GS/MA/BC/3041/07

විෂයය : බෞද්ධ ශිෂ්ටාචාරය

වර්ෂය : 2013 සැප්තැම්බර්

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

207921

LB / BK / DOM / 72 / 2014

20154
222 p

CR

CR
378.242095493
DIS

207921

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය, ප්‍රධාන උපදේශක, මහාචාර්ය පූජ්‍යපාද නායිම්බල ධම්මදස්සි හිමිපාණන් වහන්සේගේ සදුපදේශයෙන්, පුස්තකාල අධ්‍යයනය තුළින් හා සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමයෙන් ද දත්ත රැස් කිරීමෙන්, මවිසින් ස්වෝත්සාහයෙන් ම කරනු ලැබූවකි. මෙය මෙම විශ්වවිද්‍යාලයට හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යාපන ආයතනයකට හෝ ඉදිරිපත් කළ නිබන්ධයක් හෝ නිබන්ධයක කොටසක් හෝ නොවන බවත් සහතික කරමි.

මෙයට,

...............................
2013 - 11 - 19

පර්යේෂක,

නිලන්ත පී. දිසානායක

GS/MA/BC/3041/07

# උපදේශක ගේ අනුමැතිය

වාචික පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂයා විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමි.

| | |
|---|---|
| ............................................ | 20 - 11 - 2013 |
| උපදේශක ගේ අත්සන | දිනය |

# පිදුම

විඳ අපමණ දුක් ගැහැට

ඇති දැඩි කර අකුරු උගැන්වූ

ආදරණීය මවිනි, පියාණෙනි,

පුදමි වනපස මලක් ලෙස

දෙපා අභිමුව

මේ ගත...

# සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| දීනි | - | දීඝනිකාය |
| මනි | - | මජ්ඣිම නිකාය |
| සංනි | - | සංයුක්ත නිකාය |
| අංනි | - | අංගුත්තර නිකාය |
| මහා | - | මහාවග්ග පාලි |
| ඛුනි. | - | ඛුද්දක නිකාය |
| ධප | - | ධම්මපදය |
| අපදා | - | අපදානපාළිය |
| දීනිඅ | - | දීඝනිකායට්ඨ කථා |
| මනිඅ | - | මජ්ඣිමනිකායට්ඨ කථා |
| සනිඅ | - | සංයුත්තනිකායට්ඨ කථා |
| අනිඅ | - | අංගුත්තර නිකායට්ඨකථා |
| ජාඅ | - | ජාතකට්ඨ කථා |
| උදාඅ | - | උදානට්ඨ කථා |
| විමා | - | විමානවත්ථු ප්‍රකරණය |
| අස | - | අපේ සංස්කෘතිය |
| අසඋ | - | අපේ සංස්කෘතික උරුමය |
| ගබදෙ | - | ගලේ බණ්ඩාර දෙවියෝ |
| ජීමදා | - | ජීවදානයෙන් මතක දානයට |
| දඉස | - | දළදා ඉතිහාසය හා සංස්කෘතිය |
| දෙදෙ | - | දෙවොල් දෙවියෝ |
| දුබොපු | - | දුමින්දාගමනය හා බෝධි පූජාව |
| පශාසා | - | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය |
| පැලආ | - | පැරණි ලක්දිව ආගම් |
| පැලබෞඉ | - | පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය |
| පූචාස | - | පූජා චාරිත්‍ර සංහිතා |

| | | |
|---|---|---|
| බෞදව | - | බෞද්ධ දර්ශනය හා චරණය |
| බෞපූචාස | - | බෞද්ධ පූජා චාරිත්‍ර සාහිත්‍ය |
| බෞපූස | - | බෞද්ධ පුදපූජා සංස්කෘතිය |
| බෞප්‍රක | - | බෞද්ධ ප්‍රතිමා කලාව |
| බෞස | - | බෞද්ධ සංස්කෘතිය |
| බෞසංපු | - | බෞද්ධ සංස්කෘතිය හා පුදපූජා |
| බෞසංලේ | - | බෞද්ධ සංස්කෘතික ලේඛන |
| බුපූචා | - | බුදුසමය හා පූජා චාරිත්‍ර |
| බුබු | - | බුදුදහම හා බුද්ධාගම |
| මලආ | - | මධ්‍යකාලීන ලංකාවේ ආගම |
| මවගී | - | මහාවංස ගීතය |
| මවසි | - | මහාවංසය සිංහල |
| ලබුඉ | - | ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය |
| ලපාබු | - | ලක්දිව පාරිහාරික බුද්ධාගම |
| ලප්‍රේසවි | - | ලක්දිව ප්‍රේත සංකල්පයේ විකාසය |
| ශ්‍රීබෝව | - | ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉතිහාසය හා සංස්කෘතිය |
| සශාවි | - | සබරගමු ශාන්තිකර්ම විග්‍රහය |
| සිගැනා | - | සිංහල ගැමි නාටකය |
| සිදෙපු | - | සිංහල දේව පුරාණය |
| ලසිබු | - | ලක්දිව සිංහල බුද්ධාගම |
| සිබුනාල | - | සිංහල බුදුසමයෙහි නාට්‍ය ලක්ෂණ |
| සිවි | - | සිංහල විශ්වකෝෂය |
| සූකැශාස | - | සූනියම් කැපීමේ ශාන්තිකර්ම සහ සමාජය |

# අනුක්‍රමිකාව


සංකේත නිරූපණය vi

අනුක්‍රමිකාව viii

උපකාරානුස්මෘතිය xii

සාරසංක්ෂේපය xv

පළමුවන පරිච්ඡේදය

1.1 හැඳින්වීම 1

1.2 පාරිහාරික බුදුදහම 4

1.3 පර්යේෂණයේ වැදගත්කම හා විෂය ක්ෂේත්‍රය 6

1.4 අධ්‍යයනයේ අරමුණු 12

දෙවන පරිච්ඡේදය

2.1 පුදපූජා 13

2.2 බුදුසමයේ අන්තර්ගත පූජා සංකල්පය 15

2.3 බෞද්ධ පුදපූජාවන්හි පශ්චාත් කාලීන වර්ධනය 20

තෙවන පරිච්ඡේදය

3.1 ව්‍යවහාරික බුදුසමයේ ආරම්භය හා විකාසය 27

3.2 භාරතීය ප්‍රවේශය 28

3.3 ලාංකේය ප්‍රවේශය 31

3.4 ලාංකේය බුදුසමය හා පුද පූජා චාරිත්‍රයන්හි වර්ධනය 35

3.4.1 බෝධි පූජාව 39

3.4.2 චෛත්‍ය පූජා 45

3.4.3 දළදා පූජාව 47

3.4.4 පිරිත් දේශනාව 53

3.4.5 අරියවංශ දේශනාව 60

3.4.6 ගංගා රෝහණ පූජාව 62

3.4.7 ගිරිහණ්ඩ පූජාව 64

සිව්වන පරිච්ඡේදය

නූතන ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික බුදුසමයේ නව ප්‍රවණතා

4.1 බුදුරදුන් හා සම්බන්ධ පූජා 67

4.1.1 සම්බුද්ධ ඥාති පූජා 67

4.1.2 සත්බුදු පූජා 75

4.1.3 තුන්තරා බෝධි බුද්ධ පූජා 84

4.1.4 තෙසැත්තෑ ඥාන පූජාව 86

4.2 පූජාර්හ වස්තු පූජා 92

4.2.1 බෝධි පූජාවේ නව ප්‍රවණතා 92

4.2.2 නවග්‍රහ පූජා 103

4.3 දේව පූජා 106

4.3.1 කතරගම දෙවි 110

4.3.2 විභීෂණ දෙවි 113

4.3.3 දෙවොල් දෙවි 115

4.3.4 ගම්භාර සිද්ධ සූනියම් දෙවියෝ 122

4.3.5 රජ්ජුරු බණ්ඩාර දෙවි 127

4.3.6 මංගර දෙවි 133

4.3.7 කළු බණ්ඩාර දෙවි 134

4.3.8 ශක්‍ර දේව වන්දනය 136

4.3.9 ලක්ෂ්මී වන්දනය 137

4.3.10 ක්‍රිෂ්ණ ඇදහිල්ල 138

4.4. මළවුන් සම්බන්ධ පූජා 139

4.5 මෙත් බෝසත් වන්දනාව 149

4.6 ෆෙන්ෂූයි වන්දනාව 157

**පස්වන පරිච්ඡේදය**

**යාතුකර්ම හා පුදපූජා**


5.1 යාතු කර්ම 159

5.2 ලාංකේය බෞද්ධ සමාජයේ ව්‍යවහාරික ශාන්තිකර්ම 162

5.3 දේව සංකල්පය මත පදනම් වූ ශාන්ති කර්ම 165

5.3.1 කොහොඹා යක් කංකාරිය 165

5.3.2 කිරිමඩු ශාන්ති කර්මය 167

5.3.3 පහන් මඩු ශාන්තිය 169

5.3.4 දෙවොල් මඩු ශාන්ති කර්මය 171

5.3.5 කිරි දානය 173

5.3.6 මල් මඩු 175

5.4 යක්ෂ සංකල්පය පාදක කරගත් ශාන්තිකර්ම 176

5.4.1 ගරා යකුම 176

5.4.2 මහසෝන් සමයම 185

5.4.3 සූනියම් කැපීම 187

5.4.4 සන්නි යකුම 198

5.4.5 ගොපලු සමයම 203

5.4.6 හැන්දූ සමයම 203

5.5. ප්‍රේත සංකල්පය පාදක කරගත් අභිචාර විධි 204

5.6 නවග්‍රහ සංකල්පය පාදක කරගත් යාතු කර්ම 206

5.7 යාතු කර්ම සහ බෞද්ධාගමික එළඹීම 208

5.8 අණවින කොඩිවින හදි හූනියම් 217

5.8.1 අංගම් 221

5.8.2 පිල්ලි 223

5.8.3 බන්ධන 225

5.8.4 ජීවම් 226

5.8.5 පැන්නුම් 226

5.8.6 කටුගැසීම් 227

5.8.7 පෙතලි ගිනියම් 228

සමාලෝචනය 229
ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය 236
උපග්‍රන්ථය I 247
උපග්‍රන්ථය II 257
උපග්‍රන්ථය III 267
උපග්‍රන්ථය IV 278
ඇමුණුම 281

## උපකාරානුස්මෘතිය

නූතන ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික බුදුසමයේ නව ප්‍රවණතා මැයෙන් සැකසෙන මෙම පර්යේෂණාත්මක නිබන්ධය සාර්ථක අයුරින් නිමකර ගැනීම සඳහා මාහට ලැබුණු උපකාර අපමණ ය. ප්‍රථම උපාධිය ලබාගැනීමට ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණි අවධියේ සිට ම අධ්‍යයන කටයුතුවල දී නිර්ලෝභීව ශිල්ප ඥානය ලබාදුන් තත් විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය පූජ්‍ය නායිම්බල ධම්මදස්සී ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම අධ්‍යයනයේ දී ද මාගේ ප්‍රධාන උපදේශකවරයාණන් වහන්සේ ලෙස කටයුතු කළහ. පර්යේෂණ කාර්යයෙහි දී නිවැරදි මගපෙන්වීම ලබාදී ගැටලු සාකච්ඡා කරමින් සදොස් තැන් නිදොස් කරමින් උන්වහන්සේ ලබාදුන් අනුග්‍රහය මෙහි දී කෘතවේදීත්වයෙන් හා ගුරුබැතියෙන් යුතු ව නමස්කාර පූර්වක ව සිහිපත් කරමි.

අවිවේකීභාවය නො තකමින් හිතෛෂීත්වයෙන් හා මුදිතා ගුණයෙන් උපලක්ෂිත ව යුතු ව අවශ්‍ය උපදෙස් ලබාදෙමින් ද අවශ්‍ය මූලාශ්‍රයයන් සපයාදීමෙන් සහ ධෛර්යමත් කරමින් මෙම පර්යේෂණ කාර්යය සඳහා මා මෙහෙය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ. වීරසේන ගුරුපියතුමන් මෙහි දී සිහිපත් කළ යුතුම ය. එමෙන් ම මෙකී පර්යේෂණය සාර්ථක කරගැනීමට සෑම අවස්ථාවකදී ම මහත් ඕනෑකමින් උපදෙස් ලබාදුන් තත් අධ්‍යයනාංශාධිපති ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේ සහ මහාචාර්ය ආරියපාල පෙරේරා ගුරුපියතුමන් ද මෙහිලා ගෞරවයෙන් සිහිපත් කර සිටිමි.

උසස් අධ්‍යාපන ගමන් මගට කවදත් ආලෝකය ලබාදෙමින් අනුශාසනා කරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පූජ්‍ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්වාමින්ද්‍රයාණන් වහන්සේ හා තත් විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන පීඨාධිපති මහාචාර්ය පූජ්‍ය වාච්චේ ධම්මරක්ඛිත හිමිපාණන් වහන්සේ, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වහ වහා සපුරා ගන්නැයි නිරන්තරයෙන් සිහිපත් කරමින් පර්යේෂණ කාර්යය සඳහා ධෛර්යමත් කළහ.

ජීවිතයේ සියලු කාර්යයන්හි දී කල්‍යාණ මිත්‍රත්වයේ හස්තය දිගුකරමින් කටයුතු කරන ශාස්ත්‍රපති ගෞරවාර්හ විතාරන්දෙණියේ මේධානන්ද හිමියෝ මෙකී ව්‍යායාමයේ දී අවශ්‍ය

මූලාශ්‍රය සපයා දෙමින් ද උන්වහන්සේ සතු පුස්තකාලය සිතැඟි පරිදි පරිහරණය කිරීමට පහසුකම් සලසා දෙමින් සිදු කළ උපකාරය අතිමහත් වෙත්. එසේ නො වන්නට මෙම කටයුත්ත කෙටි කාලයකින් නිමා කිරීම සිහිනයක් වන්නට ඉඩ තිබුණි.

පර්යේෂණ සැලැස්ම පිළියෙල කර ගැනීමේ සිට පැනනැඟුණු විෂයානුබද්ධ ගැටලු නිරාකරණය කරගැනීමටත් අවශ්‍ය මූලාශ්‍රය සපයා දීමටත් මා වෙනුවෙන් වෙහෙස වූ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බෞද්ධ සංස්කෘතික අධ්‍යයනාංශාධිපති මහාචාර්ය පූජ්‍ය ඇකිරිගල නන්ද හිමි, පූජ්‍ය කුඩාකත්නෝරුවේ විනීත හිමි, පූජ්‍ය අලුත්ගම විමලරතන හිමි, පූජ්‍ය ඉලුක්වෙල ධම්මරතන හිමි, පූජ්‍ය පනහඩුවේ යසස්සී හිමි, පූජ්‍ය අම්පාරේ ආනන්ද හිමි, පූජ්‍ය පල්ලේගෙදර සුසීම හිමි, පූජ්‍ය කට්ටකඩුවේ චන්දවිමල හිමි, පූජ්‍ය කිරින්දේ පේමසිරි හිමි, පූජ්‍ය බෝධිමල්කඩ සුමනරතන හිමි, කථිකාචාර්ය විජිත කුමාර හා රත්නසිරි රත්නායක, කථිකාචාරිනී දීපිකා විජේතුංග ආදී සත්පුරුෂ විද්වතුන් කෘතවේදිත්වයෙන් සිහිපත් කර සිටින්නෙමි.

මෙම පර්යේෂණය ආරම්භයේ සිටම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවන්හි දී සම්බන්ධ වෙමින් කාලය, ශ්‍රමය, ධනය කැපකළ කල්‍යාණ මිතුරන් වන ජාතික තරුණ සේවා සභාවේ හම්බන්තොට දිස්ත්‍රික් අධ්‍යක්ෂ සරත් කොඩිකාර හා ප්‍රවීණ ලේඛක සුජිත් අක්කරවත්ත සොහොයුරන් දෙදෙනාට හදපිරි ප්‍රණාමය හිමිවේ. ළබැඳි සොයුර සිසිර හා දිලානි ද එහිදී සිහිවේ.

සිත්තම්ගල්ලෙන රජමහා විහාරාධිපති පූජ්‍ය අගලකඩ පියසිරි නාහිමිපාණන් හා විහාරවාසී පූජ්‍ය කපුගම්පොත වංගීස හිමියන් රජ්ජුරු බණ්ඩාර දෙවියන් පිළිබඳ තොරතුරු සොයායෑමේ දී මග පෙන්වමින් මූලාශ්‍රය සම්පාදනය කර දුන්හ.

පුස්තකාල පරිහරණයේදී සහයෝගය ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයන්හි සියලුම කාර්ය මණ්ඩලයටත් හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුස්තකාලයාධිකාරී වසන්ත දිසානායක හා පණ්ඩුල විදාන පතිරණ සහෘදයන් ද මෙහිලා කෘතවේදීත්වයෙන් සිහිපත් කරමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී තොරතුරු සැපයූ හා සම්මුඛ සාකච්ඡා ලබාදුන් ගිහි පැවිදි සියලු දෙනාටත්, පැරණි පුස්කොළ අත්පිටපත් ලබාදුන් විද්වතුන් සියලු දෙනාටත් හදවතින් ම තුති පුදමි. අත්පිටපත්වල අකුරු අමුණමින් මෙම නිබන්ධය පරිගණක ගතකළ ගංගොඩවිල, විජේවර්ධන ක්‍රියේෂන්ස්හි කුමාරි විජේවර්ධනයන්ට (හිතාදර කුමාරි අක්කා) මෙහි දී සිහිපත් කළ යුතු ම ය.

හිතාදර සමාධිත්, චූටි පුතු ඔමෙත් වත්මිරත් මෙම පර්යේෂණයේ කටයුතු ඉක්මනින් අවසන් කිරීමේ මාගේ උමතුව ඉවසා දරා සිටියහ.

එමෙන් ම මෙම පර්යේෂණ කාර්යයේ දී තොරතුරු සපයාදුන් පාරම්පරික ශාන්ති කර්ම ශිල්පීන්, කපු මහත්වරුන්, කට්ටඩි මහත්වරුන්, බලි ඇදුරන් ආදී සුධීජනයාටත් සෑම තැන්හිදී ම ළබැඳි සෙනෙහසින් පිළිගනිමින් ද අපට සංග්‍රහ කරමින් ද කටයුතු කළ සබරගමුව හා දකුණේ අහිංසක නිර්ව්‍යාජ ගැමියන්ට ද මාගේ ප්‍රශංසාව නිතැතින් ම හිමිවිය යුතු ය.

# සාරසංක්ෂේපය

ලොව සියලු ආගම් කාලයාගේ ඇවෑමෙන් විවිධ ප්‍රවණතාවන් ඔස්සේ විකාසයට පත්ව තිබේ. කාල දේශානුරූපීව විවිධ ස්වරූපයන්ට පරිවර්තනය වෙමින් බුදුසමය ඒ ඒ දේශයන්හි මුල්බැස ගැනීම සිදුව ඇත. නූතන ශ්‍රී ලංකාවේ ද ව්‍යවහාරික බුදුසමය තුළ නව ප්‍රවණතා රාශියක් දක්නට ලැබේ. විද්වතුන් බෞද්ධ දාර්ශනික සංකල්ප, ඓතිහාසික ප්‍රවණතා සහ නූතන සමාජ සංසිද්ධි කෙරෙහි බුදුදහම ලද හැකි ආභාසය පිළිබඳ විවිධ පර්යේෂණ සිදුකර තිබේ. එහෙත් නූතන ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික බුදුසමයේ නව ප්‍රවණතා (ක්‍රි.ව. 1956 - 2012 කාලය) පිළිබඳ කරන ලද පර්යේෂණයන් දක්නට නො ලැබේ. යම් යම් විමර්ශනයන් සිදුකර ඇතත් එහි දී පුළුල් පරාසයක් ආවරණය වූ බවක් දක්නට නො ලැබේ. සත්ත්වයාගේ සාංසාරික දුක සමුච්ඡේද වශයෙන් අවසන් කිරීම අරමුණු කරන බුදුදහම ශ්‍රී ලාංකේය ජන සංස්කෘතියට සර්වාකාරයෙන් බලපා තිබේ. එහෙත් වර්ෂ දහස් ගණනක විවිධාභාෂයන්ගෙන් විකාසය වූ නූතන ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික බුදුසමයේ නව ප්‍රවණතාවන් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍යාභිලාෂය වේ. මානව ශාස්ත්‍ර විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රචලිත ව පවත්නා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයාගත තොරතුරු ඔස්සේ පර්යේෂණ අරමුණ සඵල කරගැනීමේ ක්‍රමවේදය භාවිතයට ගෙන තිබේ. එහිලා ක්ෂේත්‍ර අධ්‍යයනය ද උපයෝගී කරගෙන තිබේ. ව්‍යවහාරික බුදුසමයෙහි උද්දීපනය වන නව ප්‍රවණතාවන්හිදී බුද්ධිමය හැඟීම්වලට වඩා භාවමය උත්තේජනයන්ට කෙරෙන ආමන්ත්‍රණය ඉහළ මට්ටමක පවතී. ආර්ථික, දේශපාලන, සමාජ අර්බුද හමුවේ සමාජය තවදුරටත් සුරක්ෂිත නො වන ස්ථානයක් බවට පත්වීමත්, පුද්ගල ජීවිතයේ අපේක්ෂා ආර්ථික අවකාශය මත දෝලනය වීමත් නව ආගමික ක්‍රියාදාමයන් සඳහා පුද්ගලයා තව තවත් ආසක්ත වීමට හේතු වී තිබේ. සම්බුද්ධ ඥාති පූජා, සත්බුදු පූජා, බෝධි පූජාව, මෙත් බෝසත් වන්දනාව සහ දේව විශ්වාසය ආශ්‍රයෙන් උද්දීපනය වන ප්‍රවණතාවන් මෙන් ම ක්‍රිෂ්ණ ඇදහිල්ල, ශක්‍ර දේව වන්දනය ආදිය නූතන ව්‍යවහාරික බුදුසමයෙහි ජනප්‍රිය යාතුකර්මයන් ය. එමෙන් ම දේව, යක්ෂ, නවග්‍රහ සහ ප්‍රේත ආදී බලවේග පදනම් කොටගත් යාතු කර්ම ද ඒ අතර වේ. ආගමික භක්තිය ප්‍රායෝගික ව ප්‍රදර්ශනය වන මාර්ගයක් ලෙස යාතු කර්ම හඳුනාගත හැකි ය. ආගමික සංස්ථාවන්හි ඇතිවන ගතිකත්වයට අනුරූපව නව පුද පිළිවෙත් සකස් වීම සිදුවිය යුත්තකි. එසේ නො වුවහොත් ආගම සමාජාවධානයෙන් බැහැර

විය හැකි ය. විශේෂයෙන් විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමෙන් පසු ගෙවීගිය දශක කිහිපය තුළ ව්‍යවහාරික බුදුසමයෙහි ගතිකත්වය සියුම් ව නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන කරුණක් වන්නේ ඇතැම් පුදපූජා හා යාතු කර්ම වාණිජ අපේක්ෂාවන් විසින් හැඩගස්වනු ලැබ ඇති බවයි. වෙළඳපොල ආර්ථිකය විසින් ඇතිකරනු ලැබූ පරිභෝජනවාදය බෞද්ධ පුදපූජාවන්හි හා යාතු කර්මවල ස්වරූපය ද ප්‍රමාණය ද වෙනස් කර ඇති බව ප්‍රතීයමාන වේ. ෆෙන්ෂුයි වන්දනාව, ශක්‍රදේව වන්දනය, ක්‍රිෂ්ණ ඇදහිල්ල, ලක්ෂ්මී දෙවඟන පිදීම ආදී ආගමික ක්‍රියාකාරකම් ගෝලීයකරණය හා වෙළඳපොල ක්‍රමය මත සැකසෙන ලෞකික අපේක්ෂාවන් කොතෙක් දුරට සමාජය තුළ ජනප්‍රිය වන්නේ ද යන්න කියාපායි. මේ අනුව ලක්දිව ව්‍යවහාරික බුදුසමය ප්‍රතිරෝධතාවන්ට මෙන් ම අනුපූරණයට හා අනුයෝජනයට ඉඩ ප්‍රස්ථා විවර කර ඇති පොහොසත් ආගමික සංස්ථාවක් ලෙස අර්ථ විවරණය කළ හැකි ය. ථෙරවාදී විමුක්ති මාර්ගය හා සම්බන්ධ ලෝක දෘෂ්ටියෙන් ඇතැම් පුදපූජා හා පිදවිලි ඈත් වුව ද ඒවා ජන ජීවිතය සමග අත්‍යන්තයෙන් බැඳී තිබේ. එකී ක්‍රියාකාකරම් මුල් බුදුසමයට පටහැනි වෙතැයි ගැමියෝ නො සිතති. මේ අනුව ව්‍යවහාරික බුදුසමයෙහි පැනෙන නව ප්‍රවණතා බුදුසමයෙහි පශ්චාත් කාලීන වර්ධනයක් ලෙස හැඳින්විය හැකි ය. එම පුදපූජාදිය ඒකායන විමුක්ති මාර්ගය නො වන බව සැබෑ ය. එහෙත් හුදු නිරර්ථක ක්‍රියා ලෙස වර්ග කොට බැහැර කළ නො හැකි ආගමේ සමාජ කාර්යය හා ප්‍රතිබද්ධ වූ අංග ලෙස හැඳින්විය හැකි ය.